**ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි **22** දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් ලැබීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කොළඹ අධ්‍යාපන කලාප කාර්යාලයෙන් 2021 අප්‍රේල් මාසයට අදාල දායක මුදල් ලෙස 2021 ජුනි 25 දින ලැබී තිබුණු රු.2,904,049 ක ආදායමක් 20.04.02.00 (පළාත් සභා) ගිණුමට බැර කිරීම හේතුවෙන් පළාත් සභා ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම් ගත කර තිබිණි. | පිළිගනිමි. කොළඹ අධ්‍යාපන කලාප කාර්යාලයෙන් 2021 අප්‍රේල් මාසයට අදාලව 2021 ජුනි 25 දින ලද රු.2,904,049 ක මුදල වැරදීමකින් 20.04.02.00(පළාත් සභා) ශීර්ෂයට අදාලව බස්නාහිර පළාත යටතේ **PIV** අංක 11/710 ලෙස ආදායමට බැර කර ඇත. 2022 වර්ෂය සඳහා අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී එම වරද නිවැරදි කිරීමට සටහන් කරගෙන ඇත. | නිවැරදි ආදායම් ශීර්ෂයට ආදායම් එකතු කළ යුතුය. |
| (ii) | ආදායම් ශීර්ෂය 2002-0-1-0-1-0 (කුලී ආදායම්) භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව රු.32,000 ක හර සටහනක් හා රු.46,345,321 ක බැර සටහනක් ලෙස රු.46,313,321 ක ශේෂයක් පැවතියද ගිණුම් සාරාංශයෙහි එය රු.32,000 ක හර ශේෂයක් පමණක් වූයෙන් රු.46,345,321 ක ආදායමක් **PIV** හි සඳහන් කළ ද ලෙජරයට පිටපත් කර නොතිබුණි. | මාසික ගිණුම් වාර්තා අනුව 2002-0-1-0-1-0 කුලී ආදායම් ලෙස රු. 32,000 ක හර වටිනාකමක්ද, රු.46,345,320 ක බැර වටිනාකමක්ද දක්වා ඇති අතර ඒ අනුව වර්ෂ අවසානයේ පිළියෙල කරන ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි මෙම අගයන් නිවැරදිව ඇතුළත් වන අතර එම අගයන් මත පදනම්ව අවසන් ගිණුම පිළියෙල කර ඇත. | ආදායම **PIV** මගින් ලෙජරයට පිටපත් කල යුතුය. |

**(ආ) පුනරාවර්තන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 ඔක්තෝබර් මාසය වෙනුවෙන් ගෙවන ලද රු. 40, 000 ක පරිගණක උපදේශක ගාස්තු 253-1-1-1002 (අතිකාල හා නිවාඩු දින වැටුප්) වැය විෂයයට හර කර තිබුණි. | සිගාස් වැඩසටහනට දත්ත ඇතුළත් කිරීමේදී 1003 වැය විෂයට ඇතුළත් විය යුතු රු.40,000 ක මුදල වැරදීමකින් 1002 වැය විෂයය යටතේ ගිණුම් ගත වී ඇත. 1003 වැය විෂය යටතේ රු.187,946 ක ප්‍රතිපාදන ඉතිරි වී ඇති බැවින් ප්‍රතිපාදන ඉක්මවා යාමක් සිදු වී නොමැත. | නිවැරදි වැය ශීර්ෂයට හර කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ii) | දේශීය ගමන් වියදම් ප්‍රතිපාදනය රු.4,000,000 ක් වූ අතර භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව වියදම රු.176,178 ක් ද ලෙජරය අනුව වියදම රු. 238,938 ක් ද වූයෙන් රු.62,760 ක වෙනසක් නිරීක්ෂණය විය. | මාසික ගිණුම් වාර්තා වලට අනුව වර්ෂ අවසානයේ සකස් කරන ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි ව්‍යාපෘති 1 සඳහා දේශීය ගමන් වියදම් වෙනුවෙන් කරන රු.238,938 ක හර ශේෂයක්ද රු.62,760 ක බැර ශේෂයක්ද සඳහන් වන අතර ඒ අනුව අවසාන ශුද්ධ ශේෂය රු.176,178 කි. මෙම වට්නාකම අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී යොදාගෙන ඇත. | ලෙජරය ගිණුම් හා භාණ්ඩාගාර පරිගණක සටහන් සැසඳිය යුතු බව. |

**(ඇ) මූලධන වියදම්**

-------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කරගැනීම් (253-1-1-2103) යටතේ පරිගණක මිලදී ගැනීම සඳහා ඇස්තමේන්තුවක් සිදු කර නොමැති වුවත් රු.370,000 ක් වූ පරිගණක මිලදී ගැනීම එම වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2509 යටතේ ප්‍රතිපාදන වෙන් කරගෙන ඇත්තේ තොරතුරු තාක්ෂණ අංශය සඳහා වන අතර අයවැය ඇස්තමේන්තු මඟින් පරිගණක මිලදී ගැනීම සැලසුම් කර ඇත්තේ මෙම වැය විෂය යටතේයි. 2103 යටතේ පරිගණක මිලදී ගැනීම සඳහා ඇස්තමේන්තුවක් සිදු කර නොමැත. | නිවැරදි වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කලයුතු බව |

**(ඈ) දේපල පිරියත හා උපකරණ**

------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පරිගණක වාර්තාව (SA 80) අනුව 2021.12.31 දිනට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය රු. 228,365,377 වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු. 234,163,467 (පරිගණක මොඩියුලයෙහි) විය. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් වල රු. 5,798,090 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස නිවැරදි කිරීම සඳහා 2021 වර්ෂය අවසානයේ නිකුත් කරන ලද පළමු ගිණුම් සාරාංශයෙන් පසුව ජ'නල් සටහන් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළද එය මහා භාණ්ඩාගාරය විසින් නිවැරදි කර නොමැති බැවින් මෙම වෙනස පවතී. 2022 වර්ෂයේදී මෙය ජ'නල් සටහනක් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | භාණ්ඩාගාර පරිගණක වාර්තාව හා ගිණුම් සැසඳිය යතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

## 2.1 ආදායම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------------------- | --------------------------------- | ------------------------------ |
| (අ) | වර්තමානයේ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන 07 කින් රු. 3,371,323.23 ක හිඟ කුලී ආදායමක් හිඟව පැවති අතර මින් රු.632,777 ක මුදලක් මාස 12 කට වඩා පැරණි ශේෂයන් විය. | 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු ආදායම රු. 1,121,485 කි. ඉතිරිය 2022 වර්ෂයේ මුල් කාර්තුවේදී රැස් කර ගෙන ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම් කඩිනමින් රැස් කරගත යුතුය. |
| (ආ) | 2010 වර්ෂයේ සිට පවත්වාගෙන යන ලංකා බැංකුව - ටෙලර් යන්ත්‍රය පිහිටි කොටසට හා 2021 මැයි 17 දින සිට කුලියට දී තිබුණ බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - II කොටස යන ආයතනවලින් කුලී ආදායම් රැස් කරගෙන නොතිබුණි. | ලංකා බැංකුව ටෙලර් යන්ත්‍රය සඳහා ගිවිසුම්ගත වීම සහ ගොඩනැඟිලි කුලී අයකරගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතයි. බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - 11 කොටස සඳහා තක්සේරු වාර්තාව ලබාගෙන ඇති අතර කුලී ගිවිස්නාව සකසා හිඟ කුලී ද සහිතව ගොඩනැඟිලි කුලී අයකරගැනීමට ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී. | හිඟ ආදායම් කඩිනමින් රැස් කරගත යුතුය. |
| (ඇ) | රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව අනුව මහජන බැංකුවේ ටෙලර් යන්ත්‍රය පවත්වාගෙන යන පරිශ්‍රයෙහි තක්සේරු වටිනාකම රු.65,000 ක් වුවද මාසික කුලීය ලෙස රු.30,000 ක කුලී මුදලක් පමණක් අයකර තිබුණි. | දෙපාර්ශවය විසින් අත්සන් තැබූ ගිවිසුම ප්‍රකාරව රු.30,000 ක කුලී මුදල අඛණ්ඩව අයකරගැනීම සිදුකරන ලදී.<br><br>එනමුත් කුලී ගිවිස්නාව සඳහා වැඩිමනත් වශයෙන් "අතිරේක අවබෝධතා ගිවිස්නාවක්" අත්සන් කර කුලී ගිවිසුමට ඇතුළත් කිරීමටත්, නව තක්සේරු වාර්තාව සහ ඉදිරියේ දී ලබාගන්නා තක්සේරු වාර්තාවන්හී වටිනාකම බලපැවැත්වෙන පරිදි කුලී ගිවිසුම සංශෝධනය විය යුතු බවත්, ඒ අනුව කුලී මුදල ගෙවිය යුතු බවත් ලැබුම්කාර පාර්ශවය වන මහජන බැංකුව දැනුවත් කරන ලදී. එයට | තක්සේරු වටිනාකම අයකල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | පිළිතුරු අපේක්ෂිත අතර රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතයි. | |
| (ඇ) | 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1(අ) වගන්තිය අනුව සෑම මසකම ගිණුම් සාරාංශ මඟින් හර හා බැර කරන ලද දායක මුදල් පිළිබඳ වාර්තාවක් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු බව දක්වා තිබුණ ද එම විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය තුළ දී බැර කරන ලද රු.22,595,155,044 ක දායක මුදල් පිළිබඳ වාර්තාවක් ගෙන්වා ගැනීමට කටයුතුකර නොතිබුණි.එසේම වර්ෂය තුළ සිදුකරන ලද රු.20,339,620 ක හර කිරීම් වලින් රු.19,569,428 ක හර කිරීම් තහවුරු කරගැනීම සඳහා අදාල ආයතනවලින් හර නිවේදන ලැබී නොතිබුණු අතර ඒ සඳහා සිහි කැඳවීම් කර තිබුණේ ද ප්‍රමාද සහගතවය. | අදාල ආයතනයන්ගෙන් හර නිවේදන ඉල්ලා යැවීම සහ සිහි කැඳවීම් මඟින් දැනුවත් කිරීම සිදු කර ඇති අතර, වාර්තාවන් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම එවීම හර කරනු ලබන ආයතනයේද වගකීමක් වේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අයත් ආදායම් සංකේත සඳහා මාසික වාර්තා එළඹෙන මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වුවද මාසික කාර්යසාධන වාර්තා දින 10 ත් දින 221 ත් අතර ප්‍රමාදයක් සහිතව ඉදිරිපත් කර තිබුණි. | මාසික වාර්තා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ සමඟ සැසඳීමෙන් අනතුරු ව ඉදිරිපත් කරන බවත් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ වෙබ් අඩවි වෙත මුදා හැරීම ප්‍රමාද වීමත් COVID19 වසංගතය හේතුවෙන් රාජකාරී සිදු කිරීම බිඳ වැටීමත් නිසා මාසික කාර්ය සාධන වාර්තා ඉදිරිපත් වීමට ප්‍රමාද වන බව දක්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මධ්‍යම රජයේ හා පලාත් සභා නිලධාරීන්ගේ සමාජ සංරක්ෂණ දායක මුදල් (වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල්) සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. එබැවින් සමාජ සංරක්ෂණ ක්‍රමයෙන් ප්‍රතිලාභ ලැබීමට නියමිත සාමාජික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු නොමැතිවීම තුළ ඒ අනුව හිමිවන වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හා දායක මුදල් ආපසු ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමිගැන්වීමේ දී දායක මුදල් නිශ්චිතව අඛණ්ඩව ලැබුණේ ද යන්න දෙපාර්තමේන්තුව තුළින් තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි. | සියලුම රාජ්‍ය නිලධාරින්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමේ වැඩසටහනක් 2017 ඔක්තෝබර් මාසයේ සිට හඳුන්වා දී ඇතත් අනෙකුත් ආයතනයන්හි සහය නොමැති වීමෙන් මන්දගාමී වී ඇත. වර්තමානයේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අය කිරීම් පිළිබඳ විස්තර පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් සියළුම ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත. | දායකයින් හා දායක ගෙවීම් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වා ගෙන දායක මුදල් නිශ්චිතව ලැබුණේ දැයි තහවුරු කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (උ) | 2021 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියලුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන්නේ නම් සෑම මසකම අයකිරීම් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර ගෙන්වා ගත යුතුය. නමුත් අවම වශයෙන් ඊළඟ මාසයේ 20 වැනි දිනටවත් පෙර චෙක්පත් ලබානොදුන් පළාත් සභා 5 ක් දින 06 සිට දින 33 දක්වා කාල ප්‍රමාදයක් සහිතව චෙක්පත් ලබා දී තිබුණි. | දායක මුදල් වෙන් කරනුයේ වැටුප් ගෙවන විටදී බැවින් 20 වන දින දක්වා කල් ලබා දී ඇති අතර ප්‍රමාද වන අවස්ථාවල දුරකථන සහ ලිපි මඟින් මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. මේ සම්බන්ධයෙන් ලිපි මඟින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් කොමිෂන් සභාව වෙත ඔබ කාර්යාලයටද පිටපතක් සහිතව දැනුවත් කර ඇත. මුදල් නිසි පරිදි එවීම අනෙකුත් සියළු රාජ්‍ය ආයතනයන්හි වගකීම වේ. මීට අමතරව COVID 19 වසංගතය හේතුවෙන් 2021 වර්ෂයේ දී අඛණ්ඩව රාජකාරී සිදු කිරීම බිඳ වැටීම ද මීට හේතු වූ බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඌ) | ඌව පළාත් සභාව එක් එක් මාසයට අදාල දායක මුදල් ඇස්තමේන්තු කර චෙක්පතකින් ගෙවනු ලැබුව ද අදාල මාසයට අදාල හිඟ මුදල හෝ වැඩිපුර මුදල ගැලපීමට දින 05 සිට දින 133 ක් දක්වා වූ ප්‍රමාද කාලයක් ගෙන තිබුණි. | කඩිනමින් චෙක්පත් ප්‍රේෂණය කල යුතු නිසා මාසික ගිණුම් සාරාංශයන්හි දෝෂ නිවැරදි කරන තෙක් ඇස්තමේන්තු අගය ප්‍රේෂණය කරන බවත් පසුව දෝෂ නිවැරදි කර ගැනීමෙන් අනතුරුව ලැබිය යුතු ඉතිරි මුදල ප්‍රේෂණය කරන නිසා කාල ප්‍රමාදයක් සිදුවන බවත් දන්වා ඇත. | හිඟ මුදල් ඉක්මනින් අය කරවා ගත යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂය අංක 253-1-1-1102(විදේශ ගමන් වියදම්) 253-1-1-2507(පර්යේෂණ සහ සවර්ධන වියදම්) හා 253-1-1-1508 (වෙනත් මාරුකිරීම්) වැය විෂයයන් වල රු.5,900,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් වර්ෂය තුල කිසිදු වියදමක් දරා නොතිබුණි. | කොවිඩ් වසංගත තත්වය හමුවේ විදේශ ගමන් සිදු නොවූ බැවින් හා 1508 වැය විෂය යටතේ විශ්‍රාම වැටුප් දිනය වෙනුවෙන් සැලසුම් කළ වැඩසටහන්, රාජ්‍ය ප්‍රතිපත්ති මත උත්සව අවලංගු කිරීම නිසා නොපැවැත් වූ බැවින් ඒ වෙනුවෙන් ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපාදන සියල්ල වර්ෂය අවසාන වන විටත් ඉතිරිව පැවතුණි.<br><br>ප්‍රාග්ධන වියදම් සීමා කිරීම සහ රටේ පැවති අයහපත් තත්වය හේතුවෙන් සැලසුම් කර තිබූ පරිදි සංවර්ධන හා පර්යේෂණ වැඩසටහන් සිදු කිරීමට නොහැකි වූ බැවින් 2507 වැය විෂය සඳහාද වෙන් කරන ලද ප්‍රතිපාදන සියල්ල වර්ෂය අවසාන වන විටත් ඉතිරිව පැවතුණි. | නිවැරදිව වියදම් හඳුනාගෙන ඇස්තමේන්තු පිළියල කලයුතු වීම. |
| (ආ) | වැය විෂයයන් 21 ක රු.134,350,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 42 ක් එනම් රු.56,418,627 ක් ඉතිරි වී තිබුණි. එය වැය විෂයයන්වල ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 8 ත් සියයට 80 ත් අතර පරාසයක පැවතුණි. | සියයට 8 සිට සියයට 69 දක්වා ප්‍රතිපාදන ඉතිරිව ඇති වැය විෂයයන් 18 න් 11 ක් පුනරාවර්තන වැය විෂයයන් වන අතර රටේ පැවති වසංගත තත්වය හේතුවෙන් අඛණ්ඩව කාර්යාල කටයුතු සිදු නොවීමත්, අතිකාල, ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය වියදම්, නඩත්තු වියදම් සීමා වීමත් හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | නිවැරදිව වියදම් හඳුනාගෙන ඇස්තමේන්තු පිළියල කලයුතු වීම. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ ගෙවිය යුතු පාරිතෝෂික ලෙස | 2021 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ බැරකම් ලේඛනයේ රු.198,367,277 ක වටිනාකම 2022 වර්ෂයට අදාල | බැරකම් නිවැරදිව හඳුනාගතයුතු බව. |

| | |
|---|---|
| රු.1,339,365,568 ක් දක්වා තිබුණ ද මින් රු. 155,531,324 ක් 2022 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාස වලට අදාල ගෙවීම් විය.තවද 2022 අප්‍රේල් 08 දින දක්වා ගෙවන ලද 2021 දෙසැම්බර් මාසයට අදාල රු.191,594,939 ක ගෙවීම් 2021 දෙසැම්බර් 31 දිනට බැරකමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව රු.36,063,615 කින් බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. | බව දැක්වූවත් P2202/15 හා P 2202/16 යන වවුචරවල වටිනාකම රු.62,356,876.47, 2021 වර්ෂයට අදාල වේ. ඉතිරි වවුචර් 17 හි වටිනාකම රු.136,010,400 හි මරණ පාරිතෝෂික හා සේවා පාරිතෝෂික ගෙවීම් ආතුළත්ව ඇති අතර මෙම වියදම්ද 2021 වර්ෂයට අදාල වන නමුත් වාර්තා ලබා ගැනීම සිදු කර ඇත්තේ 2022 වර්ෂයේ බැවින් 2022 වර්ෂයේ දින සඳහන්ව ඇත. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | අංක 3/1719 හා 2011අගෝස්තු 15 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය | | උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් වසර 05 කට වරක් වෛද්‍ය මණ්ඩලයකට යොමු කළ යුතු වුවත් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු නොකළ අවස්ථා 2 ක් නිරීක්ෂණය විය. | විශ්‍රාම වැටුප් අංක 24-205598 යන අය නැවත වරක් වෛද්‍ය මණ්ඩලයකට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. 24-107014 යන ආබාධිත විශ්‍රමිකාව 2022.01.26 දින මියගොස් ඇති අතර ඇයගේ ආබාධිත විශ්‍රාම වැටුප ගෙවීම නතර කර ඇත. | චක්‍ර ලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කලයුතු බව |

**(ආ) මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 371(2) (ඇ) | 5,785 | තතත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය ඉටුකළ සැනින් පියවිය යුතු වුවත්, අවස්ථා 09ක දී නිලධාරීන් 4 කට එක් අත්තිකාරමක් ලබා දී පියවීමට පෙර තවත් අත්තිකාරමක් ලබාදී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කලයුතු බව. |
| (ii) | මු.රෙ 103,104 | 113,846 | විශ්‍රාම වැටුප් අංක 57-966 යටතේ ගෙවන ලද වන්දි දීමනාව, යැපීම් දීමනාව බවට පරිවර්තනය කිරීමේ දී රු.470,496 ක අධි ගෙවීමක් සිදුව තිබූ අතර එයින් තවදුරටත් අයවීමට ඇති මුදල අදාල විශ්‍රාම වැටුප් ලාභියා මිය ගිය 2021 පෙබරවාරි මස තෙක් අය කර ගැනීමට වගකිවයුතු නිලධාරින් කටයුතු කර නොතිබුණි. | මුදල් අය කර ගැනීම සම්බන්ධව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා 2022.04.08 දින ලිපියක් යොමු කර ඇත. ඒ අනුව අදාල මුදල අය කර ගැනිමට කටයුතු කරනු ලැබේ. | - එම - |
| (iii) | මුදල් රෙගුලාසි 1645(අ)හා 1646 | | දෛනික ධාවන සටහන් හා ගමන් පිළිබඳ මාසික සාරාංශය අදාල මාසයට පසු මාසයේ 15 වෙනි දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද දෙපාර්තමේන්තුවේ වාහන 15න් 06 ක් මාස 8-12 අතර කාලයක් සඳහා දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාල ධාවන සටහන් 2022 පෙබරවාරි 14 දින විගණන කටයුතු සඳහා භාර දී ඇත. | - එම - |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | 2016 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 | 465,500 | 2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා විශ්‍රාමිකයින්ට අන්තර් දීමනා හිමි නොවිය යුතු වුවත් පොල්ගහවෙල, මාදම්පේ ප්‍රදේශීය ලේකම් කාර්යාල වලට අදාලව විශ්‍රාමිකයන් හතර දෙනෙකුට අන්තර් දීමනාව ගෙවා තිබුණි. | විශ්‍රාම දත්ත පද්ධතියට අනුව විශ්‍රාම වැටුප් අංක 50 – 1179246 දරණ විශ්‍රාම වැටුප් අංකය පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ නොපෙන්වයි. මාදපේ වාර්තාවේ සඳහන් විශ්‍රාමිකයන්ගේ වැටුප ඒකාබද්ධ කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |
| (ii) | 2019 මැයි මස 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/2019 හි 04 වන වගන්තිය | | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් සකස් කර ඇති රෙගුලාසි ඇතුළත් අත් පොතේ 292 නියෝගය ප්‍රකාරව ආණ්ඩුවෙන් විශ්‍රාම වැටුපක් ලබමින් සිටි පුද්ගලයකුගේ මරණයක් ලියාපදිංචි කළ විට ඒ බව බී 73 දරණ පෝරමයේ ලියා සතියකට වරක් එහි පිටපතක් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත එවන ලෙස අදාල බල ප්‍රදේශයේ රෙජිස්ට්‍රාර්වරුන්ට උපදෙස් ලබාදිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විගණන විමසුම් වලින් දන්වා ඇති පරිදි විශ්‍රාමිකයකු මියගිය අවස්ථා වන්හිදී බී “73” වාර්තා මඟින් ප්‍රාදේශීය ලේකම්වරු වෙත දැනුම්දීමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් රෙජිස්ටාර්වරුන් වෙත දන්වන මෙන් රා.ප.ච. 02/2019 සහ 2019 මැයි 30 දිනැති චක්‍රලේඛය මඟින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දන්වා ඇත. | - එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | 2013 ඔක්තෝබර් 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2013 | | සති අන්තයේ හා රජයේ නිවාඩු දිනවල සේවයේ යෙදවීමට හා ඒ අනුව අදාල ගෙවීම් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද සේවයේ යෙදීමෙන් පසු අනුමැතිය ලබාගත් අවස්ථා 09 ක් නියැදි පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | රටේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් අත්‍යවශ්‍ය රාජකාරී අඛණ්ඩව හා කඩිනමින් ඉටු කිරීමට සිදු වූ බැවින් මාණ්ඩලික නිලධාරින් සති අන්ත නිවාඩු දිනයන්හි රාජකාරී සඳහා යොදවන ලදි. ආසන්නතම මාණ්ඩලික නිලධාරියාගේ නිර්දේශ මත මෙම දිනයන් වලදී අත්‍යවශ්‍ය රාජකාරී සිදු කර ඇත. ලිපිකරුවන් අවශ්‍යතාවය මත කාර්යාලයට කැඳවීම නිසා රාජකාරී වල යම් ප්‍රමාදයක් සිදු වී ඇත. ඒ හේතුවෙන් මෙම ඉල්ලුම්පත් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ප්‍රමාද වී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

**(ඇ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ**

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | 2018 ජුනි 20 දිනැති අංක 01/2018 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය 06(b)ඡේදය | 30,500 | විදේශගත විශ්‍රාමිකයින් සඳහා ජීවන වියදම් දීමනා රු.2,000 ක් විය යුතු බව දක්වා ඇතත් විදේශගතවී ඇති අංක 3 -1310842 ,3-135507 හා 03-1173669 දරන විශ්‍රාමිකයන්ට රු.3,525 ක ජීවන වියදම් දීමනාවක් ගෙවා තිබු බැවින් වැඩිපුර ගෙවා තිබුණු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 03-1310842 - 2021 දෙසැම්බර් මස සිට ගෙවීම නිවැරදි කර ඇත.<br><br>3-135507 - මෙම අංකයෙන් විදේශ විශ්‍රාම වැටුපක් ගෙවීම නොකරන අතර බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගෙවීම් කරනු ලැබේ.<br>3- 1173669<br>2021 ජුලි මස සිට මෙම විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප ගෙවීම නතර කර ඇති අතර විදේශ විශ්‍රාම වැටුප ගෙවිම ආරම්භ කළ පසු වැඩිපුර ගෙවීම අය කරගනු ලැබේ. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2014 අප්‍රේල් 07 දිනැති අංක 01/2011 සංශෝධන (1) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා මාසික විශ්‍රාම වැටුප් වියදම විශ්‍රාමිකයන් සංඛ්‍යාවේ සිදුවන එකතු කිරීම් අඩු කිරීම් සංශෝධන ඇතුළත් වාර්තාවක් මාසිකව සකස් කර දෙපාර්තමේන්තු දත්ත පද්ධතියේ පාලන ගිණුම සමඟ සංසන්දනය කළ හැකි ක්‍රමවේදයකට පාලන ගිණුමක් සකස් කළ යුතු වුවත් කුරුණෑගල, කුලියාපිටිය (බටහිර) මාදම්පේ, ජා-ඇළ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එය එසේ සිදුකර නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | සියළුම විශ්‍රාම වැටුප් ගෙවීම් හා සංශෝධන ක්‍රියාවලිය මධ්‍යගත දත්ත පද්ධතියෙන් සිදු කරන බැවින්, දැනට පවතින එම ගෙවීම් ක්‍රියාවලියට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වෙනම පාලන ගිණුමක් පවත්වා ගෙන යාමට යම් අපහසුතාවයක් පැවතියත් එම වෙනස්වීම් හඳුනාගෙන පාලන ගිණුම සැකසීම ප්‍රාදේශීය ලේකම්ගේ වගකීමකි. ඒ අනුව කුරුණෑගල, කුලියාපිටිය(බටහිර), මාදම්පේ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මේ වන විට පාලන ගිණුම් පවත්වාගෙන යන බව දන්වා ඇත. ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරියේදී පාලන ගිණුමක් පවත්වා ගෙන යාමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2022 වර්ෂයේ මැයි මස සිට පාලන ගිණුම සකස් කිරීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |
| (iii) | 2009 ජනවාරි 07 දිනැති අංක 1/2009 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය. 08 ඡේදය | ආබාධිත දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු අධීක්ෂණය පූර්ණ වශයෙන් ග්‍රාම නිලධාරීන්ට පැවරිය යුතු අතර නිසි රැකවරණය ඔවුන් වෙත ලැබෙන බවට ග්‍රාම නිලධාරී වග බලා ගත යුතුය. ඒ | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මින් ඉදිරියට ත්‍රෛමාසික වාර්තා ලබා ගන්නා බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත.<br><br>උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | සම්බන්ධයෙන් ඒ ඒ ආබාධිත ලිපි ගොනුවල ත්‍රෛමාසික වාර්තාවක් ගොනුවට ඇතුලත් කලයුතු වුවත් කුරුණෑගල, උඩුබද්දාව, මාදම්පේ, කුලියාපිටියබටහිර) යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ අනුව කටයුතු කර නොතිබුණි . | අදාල වාර්තා<br><br>මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ත්‍රෛමාසික වාර්තා ලබා දෙන මෙන් අදාල ආකෘතියද සමඟ ග්‍රාම නිලධාරින් දැනුවත් කළ බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත.<br><br>කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එම වාර්තාව ත්‍රෛ මාසිකව ලබා ගැනීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත. | |
| (iv) | 2019 ජුනි 11 දිනැති අංක 1/2019 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | 2021 අයවැය යෝජනාව අනුව 2017 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගත් රාජ්‍ය නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව විශ්‍රාම වැටුප් ගැලපීම 2019 ජුලි 01 දින සිට කළ යුතු වුවත් කුරුණෑගල, උඩුබද්දාව, කුලියාපිටිය (බටහිර) කුරුණෑගල, මාවතගම මල්ලවපිටිය, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නියැදි පරීක්ෂාවේදී විශ්‍රාමිකයන් 181ක් සඳහා අදාල සංශෝධයන් සකස් කර නොතිබුණි. මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලිපි ගොනු 52ක තොරතුරු දත්ත පද්ධතියේ නොමැති වීම හේතුවෙන් සංශෝධනයක් සකස් කළ නොහැකි වී තිබුණි. | මේ වන විට ඇතැම් විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගැලපීම් සිදු කර ඇති අතර විශ්‍රාම වැටුප් ලිපිගොනු අඩුපාඩු (ප්‍රදාන පත්‍ර නොමැති වීම, නිවැරදි වැටුප ගණනය කර නොමැති වීම, තාවකාලික ගොනු අනුමත කරවා නොගැනීම ආදි) පවතින බැවින් ඒවා සම්පූර්ණ කර ගැනීමෙන් පසු අදාල සංශෝධන කටයුතු සිදු කරන බව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් දන්වා ඇත. එම අඩුපාඩු සම්පූර්ණ කරවා ගැනීම සඳහා විශ්‍රාමිකයන් වෙත හා ලේඛන ලබා ගත යුතු ආයතන වෙත ලිපි යවා ඇති බව තවදුරටත් දන්වා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (v) | 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 8/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය. | 2,899,825 | රාජ්‍ය සේවකයකු ලබන රු. 7,800 ක ජීවන වියදම් දීමනාව ඉක්මවා විශ්‍රාමිකයෙකුට ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවත් මියගිය නාවික හමුදා රණවිරුවන් 10 දෙනෙකුගේ හමුදා වැටුප සමඟ රු. 7,800 ක ජීවන වියදම් දීමනාවක් ද හමුදා වැන්දඹු විශ්‍රාම වැටුප හෝ යැපුම් දීමනාව සමඟ රු. 3,525 ක ජීවන වියදම් දීමනාවක්ද ගෙවනු ලැබීමෙන් ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද ජීවන වියදම් දීමනා ඉදිරි මාස වලදී වාරික ලෙස අය කිරීමට නියමිතය. | - එම - |
| (vi) | 2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය. | 1,028,000 | විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබා ගන්නා විට ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් අන්තර් දීමනාව ගෙවිය යුතු වුවද මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන් 11 දෙනෙකුටද උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් විශ්‍රාමියෙකුටද පිළිවලින් රු.759,000 ක් හා රු.269,000 ක් අන්තර් දීමනා ලෙස වැඩියෙන් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විගණනයෙන් පෙන්වා දුන් විශ්‍රාමිකයින් 11 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද අන්තර් දීමනාව මැයි මස සිට විශ්‍රාම වැටුපෙන් අය කිරීම ආරම්භ කර ඇත. ඒ අනුව 2022 මැයි 27 වන දින වන විට උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 40-3020 වෙත වැඩිපුර ගෙවන ලද මුළු මුදල රු.271,500 කි. 2022 මැයි මස වන විට රු. 35,000 ක් අයකර ඇති අතර තවදුරටත් අයවීමට ඇති මුදල රු.236,500 කි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |
| (vii) | 2013 දෙසැම්බර් 03 දිනැති හා අංක 6/2013 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා | 1,216,453 | නොගෙවූ විශ්‍රාම වැටුප් නියමිත මාසයට පසු මාසයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, දින 15 ත් දින 70 ත් අතර | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PEN/ACC/43 සහ 2020 නොවැම්බර් 18 දින අනුව නොගෙවූ විශ්‍රාම වැටුප් සෘජුවම | - එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2011 ජුනි 14 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි අංක 02 පරිදි | | කාල පමාවක් සහිතව ප්‍රේෂණය කර තිබුණු අවස්ථා විය. | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් ඇති දෙපාර්තමේන්තු නිල ගිණුම වෙත මුදල් බැර කරන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. | |
| (viii) | 2015 අගෝස්තු 04 දිනැති අංක 05/2015 (11) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය. | | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 6/2006 අනුව ගලපන ලද සංශෝධිත විශ්‍රාම වැටුප සමඟ ජීවන වියදම් දීමනාව රු.3,525 ක් විය යුතුය. එසේ වුවත් වැන්දඹු විශ්‍රාම වැටුපක් ලබමින් සිට විශ්‍රාම ගිය විශ්‍රාමිකයන් 12 දෙනෙකු සඳහා සිවිල් විශ්‍රාම වැටුපට අදාල ජීවන වියදම් දීමනාව ගෙවා තිබුණද එදින සිට වැන්දඹු විශ්‍රාම වැටුපට අදාල වන ජීවන වියදම් දීමනාව ගෙවා නොතිබුණි. | 21-1000024,<br>22-200700,<br>22-1000062 සහ 21-1000072 දරන විශ්‍රාමිකයන් සඳහා 2022 ජනවාරි මස සිට හිඟ වැටුප් සමඟ ජීවන වියදම් දීමනාව ගෙවීම ආරම්භ කර ඇත.<br>21-6000074 හා<br>21-1000039 දරන විශ්‍රාමිකයින්ට ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා හිඟ වැටුප්ද සකස් කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවා තිබුණද අඩුපාඩු බැවින් ගෙවා නොමැත. නිවැරදි කර 2022 ජුනි මස සිට ගෙවීම ආරම්භ කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |
| (ix) | 2016 පෙබරවාරි 25 දිනැති අංක 3/2016 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය.<br>7 වන වගන්තිය | 112,000 | විශ්‍රාම වැටුප් අංක 58 – 1265318 දරන විශ්‍රාමිකයා 2016 මාර්තු 28 දින විශ්‍රාම ගොස් තිබුණි. 2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම යන නිලධාරීන්ට අන්තර් දීමනාව හිමි නැතත් මෙම නිලධාරීයාට 2019 පෙබරවාරි 08 සිට 2021 දෙසැම්බර් 31 දක්වා අන්තර් දීමනාවක් ගෙවා තිබූණි. | විශ්‍රාම වැටුප් අංක 58-1265318 දරණ විශ්‍රාමිකයා වෙත වැඩිපුර ගෙවන ලද අන්තර් දීමනාව 2022 අප්‍රේල් මස සිට අය කරමින් පවතී. | - එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| (x) | 2014 ඔක්තෝබර් 16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි අංක 4 හි (iv) වන වගන්තිය | | ප්‍රථම ගොනුව අදාල ආයතනයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මාස 03 ක් ඇතුළත එවිය යුතු වුවත් පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දීර්ඝ කාල ප්‍රමාදයකට පසුව එවා තිබූ ගොනු 02 ක්ද පූජාපිටිය හා පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලැබී නොතිබූ ගොනු 09 ක්ද පැවතුණි, එහෙත් ඒ පිළිබඳව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කර නොතිබුණි. | පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මේ වන විට ගොනු සියල්ල ලැබී ඇති බවත් මින් ඉදිරියට මෙවැනි ගොනු සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කරනු ලබන බවත් ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත.<br><br>පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගොනු සියල්ල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවා ඇති බව දන්වා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |
| (ඉ) | ප්‍රසම්පාදන අත් පොතෙහි 8.7.1 හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 | 3,965,576 | රම්බොඩ විශ්‍රාමික නිවාඩු නිකේතනයෙහි අලුත්වැඩියා කටයුතු, ආරක්ෂිත කළුගල් බැම්ම හා දැල් වැට ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේ ප්‍රතිග්‍රහණ ලිපියෙහි වැඩ ආරම්භ කිරීමේ දිනය, කාර්යසාධන ඇපකරයේ වටිනාකම හා ඇපකරය ලබා දිය යුතු දිනය ඇතුලත් කර නොතිබූ අතර පිරිවිතර සහ කොන්දේසි වලට අනුව වැඩ නිම කර ඇති බවටත් සහතික කරන ලද ගෙවීම් කොන්දේසි වලට අනුකූල බවටත් සහතික කරමින් වැඩ අවසන් කිරීමේ සහතිකය නිකුත් කර නොතිබුණි. | ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රතිග්‍රහණ ලිපියන්හි වැඩ ආරම්භ කළ දිනය, කාර්ය සාධන ඇපකරයේ වටිනාකම හා ඇපකරය ලබා දිය යුතු දිනය ඇතුළත් කිරීමට කටයුතු කරන බව හා කාර්යය අවසන් වූ පසු කාර්මික නිලධාරි විසින් බිල්පත හා කළ වැඩ පරික්ෂා කොට සහතික කිරීමෙන් පසු ගෙවීම් කිරීම කරනු ලබයි. එබැවින් වෙනම වැඩ අවසන් කිරීමේ සහතිකයක් නිකුත් කොට නොතිබුණි. | ප්‍රසම්පාදන අත් පොතෙහි 8.7.1 හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 අනුව කටයුතු කල යුතුයි. |

## 2.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාමිකයා මිය යාමෙන් පසු බැංකු ගිණුමට බැරවූ මුදල් ඒ විගසම බැංකුව වෙතින් ගෙන්වා ගතයුතු වුවද එලෙස කටයුතු නොකිරීමෙන් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවස්ථා 02 කදී රු.92,166 ක් වෙනත් පාර්ශවයක් විසින් ලබා ගෙන තිබුණි. | 2020 නොවැම්බර් 18 දිනැති ලිපියෙන් සියළු ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇති බව දන්වා ඇත. | මිය යාමෙන් පසු බැංකු ගිණුමට බැරවූ මුදල් ඒ විගසම බැංකුව වෙතින් ගෙන්වා ගත යුතු අතර අදාල විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර වංචනිකව ලබා ගත් මුදල් ආපසු අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |
| (ආ) | මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විශ්‍රාම වැටුප් අංක 1-403699 21-75013 හා 1-504248 යන විශ්‍රාමිකයන් මිය යාමෙන් පසු බැංකු ගිණුමට බැර වී ඇති මුදල් ඒ විගසම ලබා නොගැනීම නිසා වෙනත් පාර්ශවයක් විසින් එම මුදල් ලබා ගැනීම හේතුවෙන් රු.6,392 ක වැඩිපුර ගෙවීමක් තවදුරටත් පවතින බව නිරීක්ෂණය විය. | රු. 1,191,178.12 ක මුදලක් දැනමටත් අයකර ගෙන ඇති බවත් තවදුරටත් අයකර ගැනීමට ඇති ශේෂය වන රු. 6,392.88 ක මුදල ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | -එම - |
| (ඇ) | අංක 01-600772 යටතේ විශ්‍රාම වැටුප් ලබමින් සිට 2013 නොවැම්බර් 07 දින මියගිය නිලධාරිණියගේ බැංකු ගිණුමට ඇය මිය යාමෙන් පසු මාස 29 ක කාලයක් දක්වා රු.582,423 ක විශ්‍රාම වැටුප් ප්‍රේෂණය කර තිබුණි.එයින් රු. 581,916 ක් ATM කාඩ්පතක් භාවිතා කරමින් ඉවත් කර ගෙන තිබූ නමුත් 2021 දෙසැම්බර් 31 වන විටත් එම මුදල් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | විශ්‍රාම වැටුප් අංක 600-772-01 දරන විශ්‍රාමිකයා වෙත වැඩිපුර ගෙවන ලද මුදල වෙනුවෙන් නඩු පවරන ලද අතර නඩු අංක B2019/25 යටතේ මේ වන විටත් එය විභාග වෙමින් පවතින අතර වැරදිකරුවන් නිශ්චය කිරිමක් හෝ වැඩිපුර ගෙවන ලද මුදල් අය කර ගැනීමක් සිදු කර නොමැත. | වැඩිපුර ගෙවීම් සිදුනොවන පරිදි මියයන විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු කඩිනමින් ලබාගෙන පද්ධතිය යාවත්කාලීන කරගත හැකිවන සේ වැඩපිළිවෙලක් සකස් කරගත යුතු බව හා මුදල් රෙගුලාසි 103හා 104 ප්‍රකාරව කටයුතු කර වගකිවයුත්තන් ගෙන් සිදු වූ අලාභය අයකර ගතයුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දත්ත පද්ධතිය අනුව විශ්‍රාම වැටුප් අංක 105353-0-21 දරන විශ්‍රාමිකයා ගේ ජාතික හැඳුනුම්පත් අංකය වෙනුවට විශ්‍රාමිකයා ගේ දියණියගේ ජාතික හැඳුනුම්පත් අංකය යොදා විශ්‍රාමිකයා මිය ගොස් මාස 86ක කාලයක් ගතවන තෙක් විශ්‍රාම වැටුප ලෙස රු.1,562,470 ක් ගෙවා තිබුණි. එම මුදල් ඇයගේ දියණිය විසින් ලබාගෙන තිබුණු නමුත් මේ සම්බන්ධයෙන් වූ නීතිමය ක්‍රියාමාර්ග, හෝ විනය ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු විගණනයට වාර්තා නොවූ අතර මෙම වැඩිපුර ගෙවූ මුදලින් රු. 1,036,336 ක මුදලක් තවදුරටත් අය කර ගැනීමට පැවතිණි. | විශ්‍රාම වැටුප් අංක 21-105355 විශ්‍රාමිකාවගේ දියණිය විසින් ලබා ගන්නා ලද මුදලින් කොටසක් ගෙවා ඇති අතර තවදුරටත් අයවිය යුතු මුදල රු.1,036,336 කි. මේ වන විට එම දියණිය මිය ගොස් ඇත. එම වැඩිපුර ගෙවීම සම්බන්ධයෙන් මු.රෙ. පරීක්ෂණයක් සිදු කර ඇති අතර එහිදී එම ගෙවීම අය කර ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා ඇත. | වැඩිපුර ගෙවීම් සිදුනොවන පරිදි මියයන විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු කඩිනමින් ලබාගෙන පද්ධතිය යාවත්කාලීන කරගත හැකිවන සේ වැඩපිළිවෙලක් සකස් කරගත යුතු බව හා මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර වගකිවයුත්තන් ගෙන් සිදු වූ අලාභය අයකර ගතයුතු බව. |
| (ඉ) | ගල්නෑව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් නිලධාරිනියක විසින් හිමිකම් නොමැති හමුදා වැන්දඹුවකගේ ගිණුමට රු.1,596,640 ක් බැර කර එම මුදල් විශ්‍රාම වැටුප් නිලධාරිනිය විසින් ලබා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් සිදු කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර 2012 ඔක්තෝබර් 22 වන විට රු.1,000,000 ක මුදලක් නිලධාරිනිය විසින් ගල්නෑව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ගෙවා තිබුණි .එම මුදලින් තවදුරටත් අය කර ගැනීමට තිබූ මුදල් 2021 දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබුණි. | එම නිලධාරිනිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | වගකිව යුතු නිලධාරින් සම්බන්ධව විධිමත් විනය පියවර ගත යුතු බව සහ වැඩිපුර ගෙවීම් අයකර ගතයුතු බව. |
| (ඊ) | කුරුවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ දත්ත වෙනස් කරමින් හිඟ විශ්‍රාම වැටුප් ලෙස ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටි | විශ්‍රාම වැටුප් වංචාවට සම්බන්ධගණකාධිකාරිවරයා විසින් භාවිතා කරන ලද පරිගණකයන්හි දත්ත පරීක්ෂා කර විශ්ලේෂණ වාර්තාවක් ලබා ගැනීම සඳහා මේ වන | වංචා සම්බන්ධ වගකිව යුතු නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග අනුගමනය කර මුදල් රෙගුලාසි 103,104 ප්‍රකාරව වගකිවයුත්තන් ගෙන් සිදු වූ අලාභය අයකර ගතයුතු බව. |

| | |
|---|---|
| ගණකාධිකාරීවරයා විසින් 2009 වර්ෂය සිට 2020 වර්ෂය දක්වා රු.6,758,120 ක් ඔහුගේ ගිණුමට බැර කර ගෙන තිබුණි. මෙම මුදල් 2021 දෙසැම්බර් 31 වන විටත් අය කර නොතිබුණි. | විට එම පරිගණක 02 රජයේ රස පරික්ෂක වෙත යොමු කර ඇත. එහි වාර්තාව ලද පසු ඉදිරි විමර්ශන කටයුතු සිදු කරන බව අපරාධ පරික්ෂණ දෙපර්තමේන්තුව විසින් දන්වා ඇත මේ සම්බන්ධයෙන් රත්නපුර උසාවියේ ම/උ බී 417/15 දරණ නඩුව පවත්වාගෙන යන බව තවදුරටත් දන්වා ඇත |

**2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කේවල ශේෂ එකතුව රු.172,979,542 ක් වී තිබුණු අතර එයින් වසර 03 කට වඩා වැඩි කාලයක සිට අයවීම් හිඟව පැවති ශේෂය රු.841,174 ක් ව තිබුණි. එම ශේෂවලින් නිලධාරීන් 03 දෙනෙකුගේ වසර 5 ට වැඩි ශේෂය රු.747,639 ක්ද, එක් නිලධාරියකුගේ වසර 3 – 4 අතර ශේෂය රු.93,535 ක්ද විය. | 2021 වර්ෂය තුළදී රු. 65,574 ක් අයකර ගෙන ඇති අතර රු. 190,485 ක් මාසිකව ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බවත් වසර 05 කට වඩා වැඩි ණය ශේෂ වලින් රු. 176,367 ක් ආපසු අයකර ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතින් අතර මින් රු. 45,639 කට අදාලව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නීති අංශය වෙත යොමු කර ඇති බව දන්වා තිබුණි. තවත් රු. 328,001.54 කට අදාලව විනය පරීක්ෂණ අවසන් නොමැති බවත් සේවය අත්හැර ගොස් විදේශ ගත ව සිටින රු. 146,321 ක ණය ශේෂයක් සහිත නිලධාරිනිය පදිංචි ලිපිනය සොයා ගැනීමේ ගැටළුවක් පවතින බවත් දක්වා ඇත. | අදාල හිග ශේෂ ඉක්මනින් අය කර ගත යුතුය. |

**2.7 තැන්පත් ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාමික දිනය වෙනුවෙන් ලැබුණු වර්ෂ 02 ක් ඉක්මවූ රු.4,413,050 ක තැන්පත් මුදල් රෙගුලාසි 571(3) පරිදි | එම වර්ෂ වල පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් රාජ්‍ය උත්සව සිදු කිරීම නවතා තිබූ බැවින් විශ්‍රාමික දිනය පැවැත්වීමට නොහැකි වීම නිසා එම මුදල් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ රාජ්‍ය ආදායමට ගැනීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන ඇති බව නිරීක්ෂණය විය. | පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබිණි. විශ්‍රාමික දිනය වෙනුවෙන් විවිධ ආයතන වලින් ලද පරිත්‍යාග බැවින් උක්ත කටයුත්ත සිදු කිරීම සඳහා එම මුදල් රඳවාගෙන ඇත. | |
| (ආ) | මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව වසර 2 ක් ඉක්මවූ තැන්පතු ආදායමට ගැනීමට හෝ නිදහස් කිරීමට කටයුතු කළ යුතු වුවත් රු.128,169 ක තැන්පතු සම්බන්ධයෙන් ඊට පටහැනිව කටයුතු කර තිබුණි. | වාර්තාවෙහි දක්වා ඇති තැන්පතු නිරවුල් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. |

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා ගිණුම් අංක 7041643 දරන ලංකා බැංකු ගිණුම හා පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා ගිණුම් අංක 7041644 දරන ලංකා බැංකු ගිණුම්හි ගනුදෙනු සිදුනොවන බැවින් ඒවා අක්‍රීය බැංකු ගිණුම් ලෙස පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | පළාත් පාලන වැන්දඹු අනත්දරු අරමුදල් ගිණුම හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම සඳහා ලැබෙන මුදල් වැන්දඹු අනත්දරු දායක මුදල් ගිණුම වෙත යොමු කරන ලෙස පළාත් පාලන ආයතන වෙත දන්වා ඇති නමුත් තවමත් ඇතැම් ආයතන සුළු ප්‍රමාණයක් එම ගිණුම් වෙත බැර කර ඇත. එම නිසා එම ගිණුම් පවත්වා ගෙන යාම අවශ්‍ය වී ඇත. | අක්‍රීය බැංකු ගිණුම් වසා දැමිය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 25 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුළත් විය යුතු වර්ෂයට අදාල යාවත්කාලීන කල | සංවිධාන ව්‍යුහය, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම සහ සැලසුම් කරන ලද සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික සැලැස්ම | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආයතනයේ සංවිධාන ව්‍යුහය, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම සහ සැලැසුම් කරන ලද සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුලත්ව නොතිබුණි. | යන විස්තර ඇතුළත් කර ලිපිගොනුව යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | |
| (ආ) | 2017 වර්ෂයේ සිට වර්තමානය දක්වා ක්‍රියාත්මක වැන්දඹු හා අනත්දරු නව ලියාපදිංචිය හා නැවත ලියාපදිංචිය ක්‍රියාකාරකම් ලෙස හඳුනාගෙන නොතිබු බැවින් ඒවායේ කාර්යසාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරිම සඳහා වාර්ෂිකව සියළුම අංශයන්ගෙන් තොරතුරු ලබා ගන්නා අතර එම අංශයන් මගින් එවා ඇති තොරතුරු පදනම් කරගෙන ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. | ආයතනයේ ක්‍රියාකාරකම් හඳුනාගෙන සැලැස්මක් සකස් කල යුතුය. |
| (ඇ) | ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනාගෙන ප්‍රමුඛතාව අනුව ක්‍රියාකාරකම් සැලැස්මක් සකස් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය මත ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්ව නොතිබූ Firewall හා Cert පද්ධති ස්ථාපනය සිදු කරන ලද අතර ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර ඇත. | ප්‍රමුඛතාව අනුව ක්‍රියාකාරකම් සැලැස්මක් සැකසිය යුතුය. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පර්යේෂණ හා සංවර්ධනය සඳහා රු. මිලියන 2 ක ප්‍රතිපාදන වෙන්කර තිබුනද එම කාර්යයන් සිදුකර නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ දෙපාර්තමේන්තුවේ කටයුතු සාමාන්‍ය පරිදි අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකිවීම හේතුවෙන් ඉතිරි වූ රාජකාරි කඩිනමින් අවසන් කිරීම පිළිබඳ අවධානය යොමු කිරීමට සිදු වීම හේතුවෙන් මෙම කාර්යය ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. | වෙන් කරන ලද ප්‍රතිපාදන නියමිත පරිදි ප්‍රයෝජනයට ගත යුතුය. |

## 3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියමු ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන තිබූ දිස්ත්‍රික් අනුව විශ්‍රාම වැටුප් සක්‍රීය අංශ හඳුනාගැනීම හා Scanner 10 ස්ථාපිත කිරීමේ කාර්යසාධනය 2021 සැප්තැම්බර් වනවිට සියයට 100 ප්‍රගතියක් ලෙස දැක්වුව ද 2021 අප්‍රේල් වනවිට මිලදීගෙන තිබූ ස්කෑන් යන්ත්‍ර 10 න් 3ක් 2021 නොවැම්බර් 19 වනවිට රත්ගම, මාදම්පාගම හා වදුරඹ යන ප්‍රාදේශීය කාර්යාලවලට ස්ථාපිත කර තිබුණ ද ස්කෑන් යන්ත්‍ර 7 ක් විගණන දිනය වන විට ද (2022.02.18) ගබඩා අංශයේ පැවතුණි. මේ අනුව දෙසැම්බර් මස වනවිට දක්වා ඇති කාර්යසාධන අගයන් නිවැරදි නොවුණි. | කාර්යසාධනය 100% ක් ලෙස දක්වා ඇත්තේ එම යන්ත්‍ර මිලදී ගැනීම සිදු කර අවසන් හෙයින් බවත් ඉතිරි යන්ත්‍ර මේ වන විට දිස්ත්‍රික් මට්ටමින් සිදු කෙරෙන සම්මුඛ පරීක්ෂණ සඳහා උපයෝජනය කරනු ලැබේ. | ව්‍යාපෘතියේ අරමුණ නිවැරදිව හඳුනාගෙන කාර්යසාධනය නිවැරදිව ගණනය කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්තමානයේ ස්ථාපනය කර ඇති 2021 ජුනි 21 දින මිලදී ගත් රු.1,928,700 ක්වූ නව ආරක්ෂක පද්ධතිය සඳහා සියයට 85 ක් ගෙවීමෙන් පසු, ඉතිරිය තාක්ෂණ ඇගයීමකින් පසු නිදහස් කරන බවට ගිවිසුම් ගතව තිබුණත් පද්ධතියේ ආරක්ෂණ හැකියාව පිළිබඳව හා දෝෂ හඳුනා ගැනීමේ හැකියාව පිළිබඳව තාක්ෂණ විගණනයක් සිදු කල හැකි පිළිගත් ආයතනයකින් ලබා ගත් තාක්ෂණ ඇගයීමකින් තොරව | පිරිවිතරයට අනුව සියලු පහසුකම් සපයා තිබුණද DMZ Zone පිහිටුවා අවසන් වන තුරු සියයට 15 ක මුදලක් රඳවා ගැනීමට තොරතුරු තාක්ෂණ අංශය විසින් නිර්දේශ කරන ලදී. ඒ අනුව සියයට 15 ක් රඳවා ගෙන තිබූ අතර ඉන්පසු DMZ Zone පිහිටුවීමෙන් අනතුරුව තොරතුරු තාක්ෂණ අංශයේ තාක්ෂණික නිලධාරීන්ගේ තහවුරුවක් ලබා ගෙන ඉතිරි සියයට 15 ගෙවීම් කිරීමට කටයුතු කරන ලදී. | තාක්ෂණ ඇගයීමකින් කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2021 ඔක්තෝබර් මස 11 දින රු.289,305 ක්වූ ඉතිරි මුදල් ගෙවා තිබුණි. | | |
| (ආ) | ප්‍රතිවෛරස් මෘදුකාංගය මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝප දේශ සංග්‍රහයේ - 2006 හි 3:3 ප්‍රකාරව ලංසු කැඳවීම කලින් තෝරාගනු ලැබූ සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවක් වෙතින් සිදුකල යුතු වුවද ඊට පටහැනිව ලංසු කැඳවීම සිදුකර ඇති බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන සැලැස්ම අනුව හා කාර්ය සාධන සැලැස්ම අනුව ජාතික තරඟකාරිත්ව ලංසු කැඳවීමේ ක්‍රමවේදය (NCB) අනුගමනය කරමින් මිලදී ගැනීම සිදුකරන බව දක්වා ඇතත් “ප්‍රතිවෛරස් මෘදුකාංගය යාවත්කාලීන කර ගැනීම 2018” ගොනුව අනුව මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන වල මිල ගණන් පරාසය රු.420,000 – 560,000 අතර පැවතුනි.ඒ අනුව “දැන්වීම් පළ කිරීම නාස්තියක් වේයැයි අදහස් කරන අවස්ථාවන්හී නැතහොත් දැන්වීම් පළ කිරීම, අයෝග්‍ය ලෙස මුදල් වැය කිරීමක් ලෙස සැලකෙන කුඩා වටිනාකමකින් යුත් ප්‍රසම්පාදන සඳහා” යොදාගැනීම සුදුසු බවට වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ක්‍රියාකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ - 2006 හි 3:3 ප්‍රකාරව ලංසු කැඳවීම කලයුතු බව. |
| (ඇ) | ප්‍රසම්පාදන අත්පොතෙහි 5.4.8 ප්‍රකාරව පරිගණක යන්ත්‍ර 15 ක් මිලදී ගැනීමේදී කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. | 2021 අප්‍රේල් 07 දිනැති කොන්ත්‍රාත් පිරිනැමීමේ ලිපිය මගින් කාර්ය සාධන සුරක්ෂණය ඉල්ලා ඇත. නමුදු රට තුල පැවති Covid-19 තත්වය තුල ආයතන වසා තැබීම හේතුවෙන් කාර්ය සාධන සුරක්ෂණය ලබා ගැනීම ප්‍රමාද වී ඇති අතර ඒ අතරතුර 2021 අප්‍රේල් 21 වන විට භාණ්ඩ නිසි පරිදි ගබඩාව වෙත ලැබී ඇත. ඒ අනුව 2021 මැයි 04 දින ගෙවීම් කර ඇත. එසේම ප්‍රසම්පාදනය මාර්ගෝපදේශ අනුව යමින් කාර්ය සාධන සුරක්ෂණය ලබා ගත යුතු සෑම අවස්ථාවකදීම කාර්ය සාධන සුරක්ෂණය නිවැරදිව ලබා ගැනීමට සටහන් තබාගත් බව වැඩිදුරටත් දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කලයුතු බව. |

| | | |
|---|---|---|
| (ඇ) ඇඟිලි සලකුණු යන්ත්‍ර 15 ක් මිලදී ගැනීම.<br>රු.510,000 වු ඇඟිලි සලකුණු යන්ත්‍ර 15 ක් ගබඩා වට්ටෝරු ලේඛනය අනුව 2021 අප්‍රේල් 25 භාරගෙන ඇති අතර විගණිත දින වන(2022.02.28) විටත් එම යන්ත්‍ර 15 නිකුත් නොකර ගබඩාවේ තිබුණි. | රටතුල පැවැති කොරෝනා වසංගත රෝග ව්‍යාප්තිය නිසා 2021 ජනවාරි මස රට විවෘත කිරීමෙන් පසු නැවත මැයි මාසයේ පරිගණක බෙදා හැරීමේදී ප්‍රමාදයක් සිදුව ඇත. තවද මේ වන විට එම ඇඟිලි සලකුණු යන්ත්‍ර බෙදා හැරීම ආරම්භ කර ඇත. | මිලදී ගැනීම් කඩිනමින් අවශ්‍ය කාර්යයට යෙදවිය යුතු බව. |
| (ඉ) මුද්‍රණ යන්ත්‍ර 10 ක් හා ස්කැනර් යන්ත්‍ර 15 ක් මිලදී ගැනීම | | |
| **(i)** අලුතින් ස්ථාපිත නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය පරිගණක උපකරණ ලෙස මුද්‍රණ යන්ත්‍ර 9 ක් හා ස්කැනර් යන්ත්‍ර 9 ක් මිලදී ගැනීමටද මුද්‍රණ යන්ත්‍ර 1 ක් මධ්‍යගත අංශය සඳහා මිලදී ගැනීමටද අනුමැතිය ලබා දී තිබුණි. ඊට අමතරව ස්කැනර් යන්ත්‍ර 6ක් මිලදී ගැනීමට ඇති අවශ්‍යතාවය පිළිබඳව සඳහන් වී නොතිබුණි. | අමතර ස්කැනර් යන්ත්‍ර 5 මිලදී ගනු ලැබුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අවශ්‍යතාවය මත ලබා දීම සඳහාය. | මිලදී ගැනීමට ඇති අවශ්‍යතාවය හඳුනාගෙන අනුමැතිය ලබාගත යුතු බව. |
| **(ii)** ස්කැනර් යන්ත්‍ර 15 ක් 2021 ඔක්තෝබර් 06 දින ගබඩාවට ලැබී ඇතත් 2021 දෙසැම්බර් 19 දින යන්ත්‍ර 3 ක් පමණක් නිකුත් කර තිබූ අතර 2021 අගෝස්තු 03 දින ගබඩාවට ලැබී තිබුණු මුද්‍රණ යන්ත්‍ර 10 න් 2021 නොවැම්බර් 19 දින වනවිට යන්ත්‍ර 3 ක් පමණක් නිකුත් කර 7 ක් ගබඩාවේ ඉතිරිව තිබුණි. | රටතුල පැවැති කොරොනා වසංගත රෝග ව්‍යාප්තිය නිසා 2021 ජනවාරි මස රට විවෘත කිරීමෙන් පසු නැවත මැයි මාසය ආරම්භ වීමත් සමඟ රට වසා දැමීම සිදු විය.ඒ අනුව, ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙතින් ඇඟිලි සලකුණු යන්ත්‍ර ලබා ගැනීමට පැමිණීමට නොහැකි තත්වයක් උද්ගතව පැවතීම මත මුද්‍රණ යන්ත්‍ර හා ස්කැනර් යන්ත්‍ර බෙදා හැරීමේදී ප්‍රමාදයක් සිදුව ඇත. මේ වන විට මෙම ඉතිරි ස්කැනර් යන්ත්‍ර 12 න් 2 ක් නිකුත් කර ඇති අතර ඒ අනුව මුද්‍රණ යන්ත්‍ර හා ස්කැනර් යන්ත්‍ර නිකුත් කිරීම ආරම්භ කර ඇත. | මිලදී ගැනීම් කඩිනමින් අවශ්‍ය කාර්යයට යෙදවිය යුතු බව. |
| **(iii)** මේ අනුව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදිත මුදලින් සියයට 60 ක් එනම් | කොවිඩ් හේතුවෙන් එම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද විය. එසේ වුවද මේ වන විට ගාල්ල, මාතර හා මහනුවර යන දිස්ත්‍රික්කයන්හි ජංගම සේවාවන් ආරම්භ කර ඇති අතර | මිලදී ගැනීම් කඩිනමින් අවශ්‍ය කාර්යයට පමණක් යෙදවිය යුතු වීම. |

| | |
|---|---|
| රු.2,642,008 ක් වටිනා උපකරණ 2022 පෙබරවාරි 28 (විගණිත දිනය) වන විටත් ගබඩාවේ නිශ්කාර්යයව පැවතීම හා අදාල කාර්යයන් සඳහා යොදවා නොගැනීමෙන් ආයතනයේ සැලසුම්ගත කාර්යයන් වල කාර්යසාධනය අවම මට්ටමක පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | ගබඩාවේ පවතින උපකරණ මේ සඳහා යොදාගෙන ඇත. ඒ තුළින් ගබඩාවේ ඇති යන්ත්‍රෝපකරණ ප්‍රයෝජනයට ගෙන ඇති බව දන්වමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

---------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට නිකුත්කර තිබුණු රු. 775,187 ක වූ වත්කම් වලින් රු.117,720 ක් වටිනා පරිගණක යන්ත්‍රය සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොත් වල සටහන් කර නොතිබීමෙන් ගිණුම් වලින් ඉවත් වී ඇති අතර ඉතිරි රු. 657,467 ක් වටිනා ස්ථාවර වත්කම් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොත් වල සටහන් කර ඇති බවට විගණනයට තහවුරු නොවුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මිලදී ගන්නා ලද පරිගණක යන්ත්‍ර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් සඳහා නිකුත් කිරීමේදී ගබඩාව විසින් නිකුත් කිරීමේ නියෝගයක් නිකුත් කරන අතර ලද බවට ලැබීම් නියෝගයක් අදාල ආයතනය විසින් ලබා දේ. | ස්ථාවර වත්කම් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොත් වල සටහන් කර ඇති බවට විගණනයට තහවුරු නොවුණි. |

## 3.6 පාඩු හා හානි

--------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හානි හා පාඩු පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් එවන ලද වාර්තාවල සමාලෝචිත වර්ෂයේ අවසන් ශේෂය සමඟ දෙපාර්තමේන්තුව විසින් | ප්‍රදේශීය ලේකම් කාර්යාල විසින් අනුගමනය කරන විවිධ ක්‍රම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් එවන ලද හානි පාඩු පිළිබඳ අවසාන වාර්තාව | වර්ෂ අවසාන ශේෂයන් එකිනෙකට සමාන විය යුතුය. |

| | | |
|---|---|---|
| සකස් කරනු ලබන සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂයන් නොසැසඳුනි. | අනුව හා දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වර්ෂ අවසාන හානි පාඩු ලේඛනය අතර වෙනසක් පවතින බව දන්වා තිබුණි. | |

### 3.7 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කරන ලද විගණන විමසුම් 42 කින් විගණන විමසුම් 21 කට පිළිතුරු ලබා දී නොතිබු අතර එම විගණන විමසුම් වලට අදාළ පැහැදිලි කිරීම් සඳහා ඉදිරිපත් කරන ලද ගණනය කලහැකි වටිනාකම රු 9,947,766 ක් වී තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සම්බන්ධිත අනෙකුත් රාජ්‍ය ආයතනයන්ගෙන් ද පිළිතුරු හා පැහැදිලි කිරීම් ලබාගෙන විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දිය යුතු බැවින් කාල පමාවක් පවතින බව පිළිගනිමි. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරිමට කටයුතු කළ යුතු අතර, එම විමසුම්වලට වහාම පිළිතුරු ලබා දීය යුතුය. |

### 3.8 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාම වැටුප් අංක 40-2015040 හා 4-30864 යටතේ විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයා 2019 සැප්තැම්බර් 17 නැවත විවාහ වී තිබුණු අතර අනත්දරුවා එම අවස්ථාවේදී බාලවයස්කාර දරුවෙකි. 2013 සැප්තැම්බර් 20 දිනැති හා අංක 03/2013 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 6 වගන්තිය ප්‍රකාරව මියගිය දායකයාට දාව උපන් අනත්දරුවන් සිටී නම් අනත්දරුවා වෙත අනත්දරු විශ්‍රාම වැටුප හිමි ගැන්විය යුතු වුවත් 2019 ඔක්තෝම්බර් 04 දින සිට 2021 ජූලි මාසය දක්වාම විශ්‍රාම වැටුප් අංක 40-2015040 සහ 4-30864 යටතේ පිළිවෙලින් රු.598,488 හා රු.153,834 ක මුදලක් නැවත විවාහ වූ වැන්දඹුව වෙතම ගෙවා තිබුණි. | නැවත විවාහ වූ වැන්දඹුවට වැඩිපුර ගෙවන ලද රු. 752,322 අය කර ගැනීමට හා ඇයගේ බාල වයස්කාර දරුවාට හිමි අනත්දරුවාට හිමි විශ්‍රාම වැටුප සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දැනුම් දී ඇත. | නැවත විවාහ වූ වැන්දඹුවට ගෙවීම් නතර කොට අනත්දරුවාට ගෙවීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගොස් ඇති විශ්‍රාමිකයින් එකොලොස් දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් ලෙස රු.3,327,180 ක මුදලක් ද රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගොස් ඇති විශ්‍රාමිකයින් දෙදෙනෙකුට විශ්‍රාම වැටුප් ලෙස රු.436,967 ක මුදලක් ද කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගොස් ඇති එක් විශ්‍රාමිකයෙකුට විශ්‍රාම වැටුප් ලෙස රු.48,737 ක මුදලක් ද කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගොස් ඇති විශ්‍රාමිකයන් 05 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් ලෙස රු.2,480,951 ක මුදලක් ද, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගොස් ඇති විශ්‍රාමිකයෙකුට විශ්‍රාම වැටුප් ලෙස රු.797,334 ක මුදලක් ද ලෙස එකතුව රු.7,091,169 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. මෙම ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් අයකරගෙන ඇති මුදල් ඉදිරියේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවන ලෙස දන්වා ඇති බවත් ඉතිරි වටිනාකම් කඩිනමින් අයකර ගන්නා බවත් දන්වා එවා ඇත. | වැඩිපුර ගෙවීම් සිදු නොවන පරිදි මිය යන විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු කඩිනමින් ලබාගෙන පද්ධතිය යාවත්කාලීන කරගත යුතු බව හා මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර වගකිවයුත්තන් ගෙන් සිදු වූ අලාභය අයකර ගතයුතු බව. |
| (ඇ) | විශ්‍රාම වැටුප් අංක 21-37920 දරන විශ්‍රාමිකයා 1994 දෙසැම්බර් 01 දින මියගොස් තිබුණද ඔහුට 2018 ජූලි මස දක්වා විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. වැඩිපුර ගෙවන ලද රු.2,268,080 කින් රු.231,780 ක මුදලක් බැංකුවේ ඉතිරිව තිබී ප්‍රාදේශීය ලේකම් විසින් ගෙන්වාගෙන තිබූ අතර තවදුරටත් අයවිය යුතු රු. 2,036,300 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තවදුරටත් අයකර ගැනීමට ඇති ශේෂය පිළිබඳ අදහස් දක්වා නොතිබුණි. | මියගිය ගොස් ඇති විශ්‍රාමිකයා වෙත වැඩිපුර ගෙවා ඇති තවදුරටත් අයකර ගත යුතු මුදල් කඩිනමින් අයකරවා ගත යුතුය. |
| (ඈ) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව අවස්ථා 4 කදී දීර්ඝ කාලීනව අය නොවූ වැඩිපුර ගෙවීම් රු. 159,314 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | වැඩිපුර ගෙවීම් කඩිනමින් ආපසු අයකරවා ගත යුතුය. |
| (ඉ) | බාලවයස්කරුවන්ගේ පාස් පොත් 10 ක් විධිමත්ව ලේඛණගත කර නොතිබූ අතර වටිනාකම රු. 801,800 වූ වයස අවුරුදු 18 සම්පූර්ණ වූ බාලවයස්කාර දරුවන් 6 කගේ බැංකු පාස් පොත් ඔවුනට භාරදීමට කටයුතු කර නොතිබුණි. | වාර්තාවේ දක්වා තිබූ පාස්පොත් පිළිබඳ තොරතුරු ලේඛනයේ සටහන් කළ බවත් වයස සම්පූර්ණ වූ බාලවයස්කරුවන්ට අදාල පාස්පොත් ලබා දීම සඳහා ඔවුන්ගේ තොරතුරු බැංකුව මඟින් හා අදාල ග්‍රාම නිලධාරින් මඟින් ලබා ගැනීමට කටයුතු කරන බව | විධිමත් ලේඛන පවත්වා ගත යුතු අතර වයස අවුරුදු 18 සම්පූර්ණ වී ඇති පුද්ගලයන්ගේ පාස්පොත් කඩිනමින් භාර දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බව දක්වා තිබුණි. | |
| (ඊ) | කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවකරණ ලේඛණයට අනුව විශ්‍රාමිකයන් 04 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු. 58,075 ක විශ්‍රාම වැටුපක්ද මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවකරණ ලේඛනය අනුව විශ්‍රාමිකයන් 03 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු.874,675 ක්ද අයකර නොතිබුණු අතර අය නොකිරීමට හේතුව වශයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් අය කිරීම් නතර කර ඇති බව අවකරණ ලේඛනයේ සඳහන් කර තිබුණි. | විශ්‍රාමිකයන් 04 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු. 112,655 න් රු.32,025 ක මුදලක් අය කර ගෙන්වාගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවා ඇත. රු.22,555 ක මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙන්වාගෙන ඇති අතර මැයි මස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවන බව දන්වා ඇත. ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් තවදුරටත් දන්වා ඇත. | මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර වැඩිපුර ගෙවූ මුදල් අයකර ගත යුතුයි**.** |
| (උ) | විශ්‍රාම වැටුප් අංක 27-2010729 දරන අනත්දරු විශ්‍රාම වැටුප භාරකරුවෙකු යටතේ රැකවරණය ලබන අනත්දරුවන් තිදෙනාගෙන් වැඩිමහල් දරුවා 2017 සැප්තැම්බර් 10 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වූවද ඇයගේ ප්‍රදාන කොටස වන 1/3 ක ප්‍රමාණය ඇතුළත් දල වශයෙන් රු. 313,937 ක්වූ අනත්දරු විශ්‍රාම වැටුප් දීමනාව දරුවා නමින් ප්‍රදානය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | වයස අවුරුදු 18 සම්පූර්ණ වූ විගස අනත්දරුවා නමින් වෙනමම බැංකු ගිණුමක් ආරම්භ කර ඇයගේ ප්‍රදාන කොටස ලබා දිය යුතුය. |
| (ඌ) | වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීමේ ලියාපදිංචි ලේඛනයට අනුව අයදුම්පත් අදාල අංශයට ලැබී වසරකට වැඩි කාලයක් ගත වී ඇතත් ගෙවීමට නොහැකිව 2002 සිට 2020 වර්ෂය දක්වා පවතින අයදුම්පත් ගණන 235 ක් වී තිබුණි. | අයදුම්පත්‍රයන් හි පවතින ගැටළු සහගත තත්වයන් නිසා ඒවා විසඳාගැනීමට වැඩි කාල ප්‍රමාදයක් සිදු වන බැවින් මුදල් ගෙවීම ප්‍රමාද වන බව දන්වා තිබුණි. | කඩිනමින් ගෙවීම් සිදු කළ යුතුය. |
| (එ) | විශ්‍රාමිකයා මිය ගිය බව දැනුම් දීම ප්‍රමාදවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා ඇති අවස්ථාවල එම මුදල් බැංකුවෙන් ගෙන්වා ගැනීමට කටයුතු නොකිරීම නිසා 2021 ජූලි මස සිට නොවැම්බර් මස දක්වා ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන් 12 දෙනෙකුට අදාලව රු.46,620 ක්වූ වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගෙන නොතිබුණි. | වාර්තාවෙහි සඳහන් රු.46,620 ක මුදලින් රු.26,246.20 ක මුදලක් අය කරගෙන ඇත. තවදුරටත් අය කර ගත යුතු රු.20,374.39 ක මුදල අය කර ගැනීමට සිහිකැඳවීම් යවා ඇති බව දන්වා ඇත. | විශ්‍රාමිකයින් මියයාම් වහාම වාර්තා කරන බවට සුදුසු පාලන ක්‍රමවේද හඳුන්වාදිය යුතුවීම හා වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා එවා තිබූ ලිපිගොණු 49 කින් අඩුපාඩු සකස් කිරිම සඳහා ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආපසු යවා තිබූ ලිපිගොණු 14 ක් 2020 වර්ෂයේදී අඩුපාඩු සකස් කර නැවත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවා ඇතත් අනුමත කර නොතිබුණු අතර මාවතගම, මල්ලවපිටිය, කුරුණෑගල හා පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වල තාවකාලික ලිපිගොනු 19 ක් සඳහාද අනුමැතිය ලබා නොදීම හෝ දීම සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කර නොතිබීමෙන් ඒවායේ විෂමතාවයන් ගැලපීමට නොහැකි වී තිබුණි. | ලිපිගොණු අඩුපාඩු සකස් කිරිම සඳහා ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආපසු යවා ඇත,<br><br>මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක<br><br>4-58611 ගොනුව අනුමත කර සහ විශ්‍රාම වැටුප් අංක 1-600421 ගොනුව අඩුපාඩු ඇති බැවින් සම්පූර්ණ කර ගැනීමට අදාල ආයතන වෙත දන්වා ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත.<br><br>මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් තාවකාලික ගොනු අඩුපාඩු සකස් කර නැවත 2022 මාර්තු 04 දින ලැබී ඇත.පරික්ෂා කරමින් පවති.<br><br>කුරුණෑගල, මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත් තාවකාලික ගොනු අඩුපාඩු සකස් කර නැවත ලැබී ඇත.පරික්ෂා කරමින් පවති.විශ්‍රාම වැටුප් අංක 21-200784 ගොනුව අනුමත කර යවා ඇත.<br><br>පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාවකාලික ගොනු 3 ක අඩුපාඩු ඇති බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යවා ඇති අතර ගොනු 02 ක් නැවත ලැබී ඇත. පරික්ෂා කරමින් පවති. | තාවකාලික ගොනු කඩිනමින් පරීක්ෂා කර අනුමත කල යුතු බව. |
| (ඔ) | ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව වැන්දඹුව මිය යෑම නිසා විශ්‍රාමිකයන් දෙදෙනෙකුට වැඩිපුර ගෙවන ලද රු.379,428 ක මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | වැන්දඹුව මිය යාම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී ඇති ශේෂයන් සඳහා මු.රෙ.104 අනුව ඉදිරි කටයුතු සිදු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බව දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර වැඩිපුර ගෙවූ මුදල් අයකර ගත යුතුයි. |
| (ඕ) | විශ්‍රාම වැටුප් අංක 4-30570 හා 3-1020822 විශ්‍රාමිකයන් දත්ත පද්ධතිය තුළ පෙන්නුම් කළ ද පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව ඔවුන් නමින් ගොනුවක් නොවීය. | එම ගොනු අක්‍රිය තත්වයේ පවතින ගොනු දෙකක් බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | සෑම විශ්‍රාමිකයෙකුමට අදාල තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | විශ්‍රාම වැටුප් අංක 4 – 4197 හා විශ්‍රාම වැටුප් අංක 1-156780 දරන විශ්‍රාමිකයාට හමුදා සේවා වැටුප හා ජීවන වියදම් දීමනාව සමඟ විශ්‍රාම වැටුප් ගෙවීම හේතුවෙන් පිළිවෙලින් රු.359,650 ක් හා රු.292,575 ක් ලෙස එකතුව රු.652,225 ක් වැඩිපුර ගෙවා තිබුණි. 1990 සිට 2014 දක්වා වර්ෂවල ගණනයන් සඳහා ප්‍රමාණවත් දත්ත නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වැඩිපුර ගෙවීම් සම්බන්ධව මුදල් රෙගුලාසි 103, 104 පරිදි ක්‍රියාකර වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය. |
| (ග) | විශ්‍රාම වැටුප් 2 ක් ලබන විශ්‍රාමිකයකු විසින් ජීවිත සහතික ඉදිරිපත් නොකල හොත් විශ්‍රාම වැටුප් දෙකම අක්‍රීය කලයුතු වුවද ,විශ්‍රාම වැටුප් දෙකක් ලබන විදේශ විශ්‍රාම වැටුප් ලාභින්ගේ එක් විශ්‍රාම වැටුපක් සක්‍රීය (ACTIVE) කර අනෙක අක්‍රීය(HOLD) කර තිබුණු අවස්ථා 47 ක් පැවතිණි. | 2022 වර්ෂය වෙනුවෙන් ජීවිත සහතික ලබා නොමැති නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් දෙකම අක්‍රිය කිරීමටත් 2022 වර්ෂය වෙනුවෙන් ජීවිත සහතික ලැබී ඇති ගොනු වෙනුවෙන් විශ්‍රම වැටුප් දෙකම ගෙවීමටත් කටයුතු කරන බව දන්වා ඇත. | ජීවිත සහතික ඉදිරිපත් නොකිරීම නිසා විශ්‍රාම වැටුප් දෙකම අක්‍රීය කල යුතුය. |
| (ච) | විශ්‍රාම වැටුප් අංක 23-1000021 දරන අයට අනත්දරුවකුගේ භාරකරු වශයෙන් 2007 සිට විශ්‍රාම වැටුප් ගෙවා තිබුණද ආරම්භයේ සිට මේ දක්වා ගෙවා නොමැති ජීවන වියදම් දීමනාව රු.527,862 ක් විය. | පිළිතුරු ලබා දී නොමැත. | ජීවන වියදම් දීමනාව ගෙවිය යුතුය. |
| (ජ) | 2020 හා 2021 වර්ෂ වෙනුවෙන් ජීවත්වීමේ සහතික ලබානොදී තිබියදීත් 03 – 1173669 දරන විශ්‍රාම වැටුප් අංකයට අදාලව විශ්‍රාම වැටුප නතර කල දිනය වු 2021 ජූලි 10 දක්වා රු.658,810.26 ක මුදලක් ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වාර්ෂික ජීවත් වීමේ සහතික ලබානොදෙන විශ්‍රාමිකයන්ගේ ගෙවීම් කඩිනමින් නතර කළ යුතුය. |
| (ට) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර විශ්‍රාමික ලිපිගොනුව මාරුකර තිබුණද දත්ත පද්ධතිය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් ගඟවට කෝරලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් විශ්‍රාමිකයකු සඳහා 2004 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා විශ්‍රාම වැටුප් අංක 01-603037 සහ<br><br>01-1603037 යටතේ විශ්‍රාම වැටුප් දෙකක් සාවද්‍ය ලෙස ගෙවා තිබුණි . මු.රෙ 104 පරික්ෂණය මගින් 2008 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා | විශ්‍රාම වැටුප් අංක 01-1603037 හා 01-603037 යටතේ විශ්‍රාම වැටුප් දෙකක් ලබා ගත් මිය ගිය විශ්‍රාමිකයාගෙන් අයවිය යුතු මුදල රු.1,847,708.85 කි. ඔහුගේ නීත්‍යානුකූල භාර්යාව විසින් වැන්දඹු අනත්දරු වැටුප සකස් කිරීම සඳහා විවාහ සහතිකයක් ඉදිරිපත් කළ පසු ඒ පිළිබඳව අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයෙන් පරීක්ෂා කරන ලදි. එහිදී එම විශ්‍රාමිකයා ගේ විවාහ | විශ්‍රාම වැටුප් ගොනුවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මාරු කරන සෑම අවස්ථාවකදීම දත්ත පද්ධතිය යාවත්කාලීන වේ දැයි නිරන්තර පරීක්ෂාවට ලක් වන පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කල යුතුය. මු.රෙ 103,104 ප්‍රකාරව සියලු කාලසීමාවන්ට අදාලව වැඩිපුර ගෙවන ලද මුදල් තක්සේරු කර නැවත අය කර ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | වැඩිපුර ගෙවන ලද මුදල රු .2,169,551 ලෙස තක්සේරු කර තිබුණ නමුත් 2008 වර්ෂයට පෙර වූ මාස 41 ක කාලයක් සඳහා වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම ගණනය කර නොතිබුණි. මෙම විශ්‍රාමිකයා 2021 මාර්තු 02 දින මිය ගොස් තිබූ අතර විශ්‍රාම වැටුප නතර කල දින සිට මියගිය දිනය දක්වා ඔහුගෙන් අයකරගත් මුදල් අඩු කල පසුව තවදුරටත් රු.1,847,708.85 ක මුදලක් අයකර ගැනීමට පැවතුණි. | සහතික 04 ක තොරතුරු අනාවරණය වී ඇත. වැන්දඹු අනත්දරු හිමිකම ඉල්ලා ඇති විවාහ සහතිකය සත්‍යය බවත් එම විවාහය අවලංගු කර තිබේද යන්න අධිකරණය මඟින් විමසා දැනගන්නා ලෙසත් බදුල්ල දිස්ත්‍රික් රෙජිස්ටාර් විසින් දැනුම් දී ඇත. මෙම ගැටළු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව වැන්දඹු අනත්දරු වැටුප සකස් කර ගැනීමට පියවර ගන්නා බවත් එහිදී උක්ත මුදල අයකර ගැනීමට කටයුතු කරන බවටත් ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | කල යුතු බව. |
| (ඩ) | ජීවිත සහතික ඉදිරිපත් නොකිරීම නිසා 2018 ජූලි සහ 2019 ජූනි මාසවල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් නතර කරන ලද විශ්‍රාමිකයින් පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂාවේදී තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් දෙදෙනෙකු සහ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් තිදෙනෙකු මිය යාම හේතුවෙන් ජීවිත සහතික ඉදිරිපත් කර නොතිබුණි .විශ්‍රාමිකයා මියයාම ග්‍රාම නිලධාරී හෝ පවුල්වල ඥාතීන් විසින් වැටුප් අංශය වෙත දැනුම් නොදීම හේතුකොට ගෙන මියගිය දින සිට ප්‍රධාන කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් නතර කරන තෙක් එකතු වටිනාකම රු.2,068,762 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. එසේ වැඩිපුර ගෙවූ මුදල් හඳුනාගෙන මුදල් රෙගුලාසි 103,104 ප්‍රකාරව කටයුතු කර නැවත අයකර ගැනීමට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය වැඩි දියුණු කළ යුතු අතර මුදල් රෙගුලාසි 103, 104ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගතයුතු බව . |

| | | | |
|---|---|---|---|
| (ඣ) | අංක 1-603326 හා 21-500158 මගින් සිවිල් හා වැන්දඹු ලෙස විශ්‍රාම වැටුප් 02 ක් ලබමින් සිට මිය ගිය විශ්‍රාමික නිලධාරිනියක් වෙත වැඩිපුර ගෙවා තිබුණු රු.2,696,303 ක් වූ විශ්‍රාම වැටුපෙන් 2020 දෙසැම්බර් 18 වන විටත් අයකර ගෙන නොතිබුණු මුදල රු .2,388,251 ක් වී තිබුණි. | විශ්‍රාම වැටුප් අංක 01-603326 හා 21-500158 විශ්‍රාමිකාව වෙත වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගැනීම වෙනුවෙන් ගොනු කරන ලද අංක 24/ 2019 දරණ නඩුව විභාග වෙමින් පවතින අතර වැරදිකරුවන් නිශ්චය කිරිමක් හෝ වැඩිපුර ගෙවන ලද මුදල් අය කර නොමැත. | වැඩිපුර ගෙවීම් සිදුනොවන පරිදි මියයන විශ්‍රාමිකයන් පිලිබඳ තොරතුරු කඩිනමින් ලබාගෙන පද්ධතිය යාවත්කාලීන කරගත හැකිවන සේ වැඩපිලිවෙලක් සකස් කර ගතයුතු බව හා මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර වගකිවයුත්තන් ගෙන් සිදු වු අලාභය අයකර ගතයුතු බව. |
| (ට) | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවදුරටත් අයකරගත යුතු වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම රු.මිලියන 597 ක් වී තිබුණි. මෙම ශේෂය වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.241,187 ක්ද වර්ෂ 5 සිට වර්ෂ 10 දක්වා කාල පරාසයක සිට පැවත එන රු.මිලියන 39 කින් ද හා වර්ෂ 5 ට අඩු කාලයකට අයත් රු.මිලියන 558 කින් ද සමන්විත විය. | 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකර ගත යුතු මුදල රු.මිලියන 597.94 ක් ලෙස දක්වා තිබුණි. | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අප්‍රමාදව අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

-----------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 2030 දී ඉටුකර ගැනීමට ඉලක්ක කර ඇති තිරසාර සංවර්ධනය සඳහා වන අරමුණු යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එක් අරමුණක් පමණක් හඳුනාගෙන තිබුණි. එම අරමුණ සම්බන්ධයෙන් ද පැහැදිලි ඉලක්ක පිහිටුවා නොමැති අතර පාදක දත්ත හා ප්‍රගතිය මැන බැලීමේ දර්ශක ක්‍රමවත්ව පිහිටුවීමක් සිදුකර නොමැත. තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාර්ය හා සම්බන්ධ වන උනන්දුවක් දක්වන පාර්ශවයන් ද හඳුනාගෙන නොතිබුණි. | මෙම අරමුණ ළඟා කර ගැනීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පමණක් සිදු කළ නොහැකි වුවද විශ්‍රාම යාමෙන් පසු ලබා දිය හැකි ප්‍රතිලාභ පිළිබඳව, සමාජයේ සියළු ස්ථර ආවරණය වන පරිදි පුළුල් විශ්‍රාම වැටුප් ආවරණ ක්‍රමයක් සැකසීමට අදාල මූලික සංකල්පය සහ යෝජනා 2020 වර්ෂයේදී “සැමට විශ්‍රාම” යෝජනාවලිය මගින් ඉදිරිපත් කර ඇත. තවද එම ප්‍රතිපත්තිමය යෝජනාවලිය රාජ්‍ය සේවා අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇති අතර අමාත්‍යාංශය වෙතින් මේ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් ලැබිය යුතුව ඇත. | තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කලයුතු බව. |

**5.** **යහපාලනය**

------------

**5.1** **අභ්‍යන්තර විගණනය**

-----------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| මු.රෙ. 133 (2) අ (1) ප්‍රකාරව, අභ්‍යන්තර විගණනය විසින් ආයතනයේ මුදල් කටයුතු පිළිබඳව පාලන ක්‍රම වල වැරදි හා වංචා වැලැක්වීම සඳහා දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි වල විධිමත් බව, ප්‍රමාණවත් බව අඛණ්ඩව සමීක්ෂණය හා සැලසුම් හා තත්‍ය ක්‍රියාකාරීත්වය සාර්ථක දැයි සොයා බැලීම කල යුතුය. නමුත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව, අනෙකුත් විගණනයන්ට අමතරව ආයතනයේ අංශ දෙකක විගණන කටයුතු සිදුකිරීමට සැලසුම් කර තිබුණද, එම කාර්යයන් ඉටුකර නොතිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් කාර්යාලය වසා තැබූ බැවින් ආයතනයේ විගණනයන් සිදු නොකළද ප්‍රා.ලේ කාර්යාල වලට අදාලව නිවසේ සිට මධ්‍යම දත්ත පද්ධතිය හරහා විශ්‍රාම වැටුප් ගෙවීම් පරික්ෂාවන් සිදු කළ බව දන්වා තිබුණි. | සැලසුම් කළ පරිදි අදාල විගණනයන් සිදු කළ යුතුය. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- | --- |
| (අ) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්කිරීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන් අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 3 ක් හා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කර ඇති | පිළිතුරු ලබා දී නොමැත. | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විශ්‍රාම වැටුප් නිලධාරීන් 25 ක් සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබා දී තිබුණි. එම තනතුරුවල වැඩ බැලීමේ කාලය 2021 දෙසැම්බර් 31 දින වන විට මාස 2 සිට මාස 89 දක්වා පරාසයක පැවතුණි. | | |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලය 1192 ක් හා සත්‍ය කාර්ය මණ්ඩලය 1034 ක් වුයෙන් පුරප්පාඩු 158 ක් විය. සත්‍ය කාර්ය මණ්ඩලය තුල අනියම් තනතුරු 01 ක් හා කොන්ත්‍රාත් තනතුරු 02 ක් පැවතුණි. | 2021.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1192 ද සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 1034 වේ. | අනුමත කාර්ය මණ්ඩලය ආවරණය වන පරිදි පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |